


# ආකර්ශණීය අනුග්‍රාහකයෙකු වේ නම් දැල්පන්දුවට ප්‍රේක්ෂක ආකර්ශණය ලබා ගැනීම පහසුයි.

*- ගයාත්‍රී ලංකා තිලක*

''දැල්පන්දු කියන්නේ ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්ත වූ ක්‍රීඩාවක්. ඒ වගේම අන්තර් ජාතික වශයෙන් සංසන්දනය කර බැලුවද අපේ දැල්පන්දු ක්‍රීඩාව දෙවෙනි වන්නේ ක්‍රිකට් ක්‍රීඩාවට පමණක් යැයි පැවසීම අසාධාරණ ප්‍රකාශයක් කියල මට නම් හිතෙන්නෙ නැහැ. නමුත් මේ ක්‍රීඩාවට තවමත් ලංකාව ඇතුළත නිසි පිළිගැනීමක් නොලැබීම නම් කණගාටුවට කරුණක්.''

ඒ අදහස් දැක්වීම වර්තමාන ශ්‍රී ලංකා දැල්පන්දු කණ්ඩායමේ නායිකා ගයාත්‍රී ලංකා තිලකගෙයි.

''ශ්‍රී ලංකාව ආසියානු දැල්පන්දු ශූරතාව සිව් වතාවක්ම ජයග්‍රහණය කර තියෙනවා. අපට එම ශූරතාව අහිමි වූ බොහෝ අවස්ථාවල අපි අනුශූරතාව හෝ තෙවන ස්ථානය දිනා ගත්තා. ඒ නිසා ශ්‍රී ලංකා පිල මුළු මහත් ආසියාව තුළම පෙරළිකාර දැල්පන්දු කණ්ඩායමක් ලෙස ප්‍රකටයි. එහෙත් තවම දැල්පන්දු ක්‍රීඩාවට ලංකාවේදී ඉහළ රසික ආකර්ශණයක් දිනා ගන්න බැරිවීම අවාසනාවන්ත තත්ත්වයක්.''

ගයාත්‍රී එසේ කියා සිටියේ වේදනාවෙන් යුතුවයි. දේශීය දැල්පන්දු ක්‍රීඩාවට විශිෂ්ඨ ක්‍රීඩිකාවන් රැසක් දායාද කළ කළුතර බාලිකා විදුහල නියෝජනය කරමින් 12 හැවිරිදි වියේදී ගයාත්‍රී ක්‍රීඩා පිටියට පිවිස තිබුනේ ඇගෙ සොහොයුරිය අරෝෂා ලංකාතිලක පසුපස පියවර තබමිනි.
සුනිලා ලේකම් වසම් හා ජානකී ගුණසේකර යන පුහුණුකාරියන් ගේ මඟපෙන්වීම යටතේ පාසල් සමයේදී සුපිරි දැල්පන්දු ක්‍රීඩිකාවක බවට පත්වූ ගයාත්‍රීට 1994 වසරේ ශ්‍රී ලංකා පාසල් දැල්පන්දු පිල නියෝජනය කිරිමේ අවස්ථාව පළමුවරට උදාවූවාය. ඒ ඕස්ට්‍රේලියාවේ පැවැති තරගාවලියක් වෙනුවෙනි.

පාසල් දිවිය අවසන් කිරීමෙන්පසු ඇයට ශ්‍රී ලංකා දැල්පන්දු කණ්ඩායමේ දොර විවෘ. විය. ඒ අනුව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඇය 1997 වසරේ සිංගප්පූරුවේ පැවැති ආසියානු ශූරතා දැල්පන්දු තරගාවලියට සහභාගි වූවාය. එහි ශූරතාව ශ්‍රී ලංකාවට හිමිවිය. මේ නිසා ජාතික පිල නියෝජනය කළ පළමු අවස්ථාව ඇයට රතු පලස මතින් පියවර තබමින් සටහන් කරන්නට ඉඩ සලසා දී තිබුණි.



මේ වනවිට ශ්‍රී ලකා දැල්පන්දු කණ්ඩායම සමග ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, නවසීලන්තය, එංගලන්තය, ජැමෙයිකාව, ඉන්දියාව ඇතුළු රටවල් රැසක සංචාරය කර ඇති ගයාත්‍රී 2003 වසරේ ජැමෙයිකාවේ පැවැති ලෝක කුසලාන තරගාවලියට සහභාගි වූයේ ශ්‍රී ලංකා පිලේ උපනායිකාව ලෙසිනි.
ඇය පළමු වරට ශ්‍රී ලංකා පිලේ නායකත්වයට පත්වූයේ 2004 වසරේ සිංගප්පූරුවේ පැවැති දැල්පන්දු ටෙස්ට් තරගාවලියේදීය.

කෙසේ වුවත් අවසන් වරට 2005 වසරේ සිංගප්පූරුවේ පවත්වන ලද ආසියානු ශූරතා දැල්පන්දු තරගාවලියේ ශූරතාව මැලේසියාවටත්, අනුශූරතාව සිංගප්පුරුවටත් හිමිවූ බැවිනි ශ්‍රී ලංකා පිලට එහි තෙවැනි ස්ථානය භාර ගන්නට සිදුවී තිබුණි.
ලෝක ශ්‍රේණි ගත කිරීම් අනුව ශ්‍රී ලංකා දැල්පන්දු පිලට හිමිව ඇත්තේ 16 වැනි ස්ථානයයි. නමුත් ශ්‍රී ලංකාව ඊට වඩා බොහෝ ඉදිරියෙන් සිටිය හැකි කණ්ඩායමක් බව ගයාත්‍රීගේ අදහසය. එහෙත් ඒ සඳහා මගහැර යායුතු බාධා කිහිපයක්ම ඇති බව පවසන ඇය ඕනෑම ක්‍රීඩාවක සීඝ්‍ර සංවර්ධනයක් ඇති කිරීමට ප්‍රධාන අනුග්‍රාහකයෙකුගේ උපකාර තිබිය යුතු බව අවධාරණය කළාය.

ශ්‍රී ලංකා දැල්පන්දු කණ්ඩායමට අනුග්‍රාහය දැක්වීමට කැමැත්තක් දක්වන ව්‍යාපාරික සමාගමක් තවමත් ඉදිරිපත් නොවීම ගයාත්‍රී දකින්නේ අවාසනාවන්ත තත්ත්වයක් ලෙසින්ය.

කණ්ඩායමක් ලෙස එක දිගට පුහුණු කටයුතුවල නිරතවීම ජාතික පිලක් අනිවාර්යයෙන්ම අනුගමනය කළයුතු පිළිවෙතක් නමුත් ශ්‍රී ලංකා පිල කණ්ඩායමක් ලෙස පුහුණු කටයුතුවල නිරතවීම ආරම්භ කරන්නේ තරගාවලියක් ආසන්නයේ දී පමණක්වීම තවත් අඩුපාඩුවක් සේ ඇය පෙන්වා දුන්නාය.

ප්‍රබල විදේශීය කණ්ඩායම් සමග තරග කිරීමේ අවස්ථා අල්පවීම තවත් බාධාවකි. ශ්‍රී ලංකා පිල 2005 වසරේ පැවැති ආසියානු දැල්පන්දු තරගාවලියෙන් පසු විදේශීය තරගාවලියකට සහභාගි වී ඇත්තේ පසුගියදා කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේ පැවැති තුන්කොන් දැල්පන්දු තරගාවලියේදීය. එහෙත් එම තරගාවලියට සහභාගි වූයේ ඉන්දියාව හා බංග්ලාදේශය වැනි දුර්වල කණ්ඩායම් බැවින් ශ්‍රී ලංකා පිලේ ක්‍රීඩිකාවන්ට තම කුසලතා දියුණු කර ගැනීමට ඉන් ලකුණු ප්‍රයෝජනය බොහෝ අල්ප විය.

දේශීය දැල්පන්දු ක්‍රීඩාව ඉහළ නැංවීමට දීර්ඝ කාලීන සංවර්ධන සැලසුමක් තිබිය යුතු බව පවසන ගයාත්‍රී එහෙත් ඒ හැම දෙයක්ම කරන්නට මුදල් අවශ්‍ය බවද සඳහන් කළාය. මේ නිසා දැල්පන්දු ක්‍රීඩාවට අනුග්‍රහය දැක්වීමට ව්‍යාපාරික ආයතන සොයා ගැනීමේ මෙහෙයුම පළමුවෙන්ම දියත් කළ යුත්ත සේ ඈ පෙන්වා දුන්නාය.

වර්තමාන ජාතික පිලට ගාලු පලාත නියෝජනය කරණ පාසල් ක්‍රීඩිකාවන් දෙදෙනෙකු වූ නොයෙලින් පෙරේරා හා අකිලා ජයවර්ධන ද එක්ව සිටින බවත්, ක්‍රීඩා කුසලතාව පමණක් නොව, අද ජාතික පිලට එක්වීම සඳහා ශක්තිමත් ආර්ථික පසුබිමක්ද ක්‍රීඩිකාවන් සතුව තිබිය යුතු නොවේදැයි පවසන ගයාත්‍රී එහෙත් මීට කලකට පෙර ක්‍රීඩා අමාත්‍යාංශය ජාතික පිලේ ක්‍රීඩිකාවන්ට රුපියල් 5000 ක් පෝෂණ දීමනාවක් ලබාදුන් බව සිහිපත් කළා.

''කොහොම නමුත් කලින් කලට අමාත්‍යාංශ පරිපාලනයේ ඇතිවන වෙනස්කම් මත අද ඒ සියලු හොඳ කටයුතු නතර වෙලා. ඒත් ජාතික පිලට එක්ව සිටින දුර බැහැර ක්‍රීඩිකාවන්ට පමණක්වත් එවැනි දීමනාවක් ලබාදීම නැවත ආරම්භ කළ යුත්තක්'' ඒ ගයාත්‍රීගේ අදහසය.
ලබන සැප්තැම්බර් මාසයේ පැවැත්වෙන පස්කොන් අන්තර් ජාතික දැල්පන්දු තරගාවලිය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා පිල මේ දිනවල පුහුණු කටයුතුවල නිරතව සිටිති. එහිදී ශ්‍රී ලංකා පිලට නායකත්වය දෙන ඈ ජයග්‍රහණය අපේක්ෂාවෙන් පසුවන්නීය.

මැදපෙළ මෙන්ම ඈ දක්ෂ ආරක්ෂක ක්‍රීඩිකාවකද වන ගයාත්‍රී ලංකා තිලකගේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ 2009 වසරේ පැවැත්වෙන ආසියානු ශූරතා දැල්පන්දු තරගාවලියේ දී තම නායකත්වය යටතේ ශ්‍රී ලංකා පිලට එහි ශූරතාව තිළිණ කොට ක්‍රීඩා පිටියෙන් සමු ගැනීමය.

## බේඩිට මුරලිගෙන් එන්තරවාසියක්

(ලංකා ඊ නිව්ස් ) ඉන්දියානු හිටපු ක්‍රිකට් නායකයකු වන බිෂන් බේඩි විසින් කරන ලද චෝදනාවකට නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා සුපිරි දඟ පන්දු යවන මුත්තයියා මුරලිදරන්ගේ කළමනාකරු පවසයි.

හිටපු ඉන්දීය පන්දු යවන්නකු වන බේඩි නොබෙ-ර්දා මුරලිදරන් පන්දුව දමා ගසන්නකු බව චෝදනා මුඛයෙන් ඉතා බරපතල විවේචනයක් කොට ඇත. මෙම චෝදනාව සම්බන්ධයෙන් බේඩි මහතා හට එන්තර වාසියක් යැවූ බව මුරලිදරන්ගේ කළමනාකරු වන කුසල් ගුණසේකර මහතා ඉන්දියානු රූපවාහිනී ප්‍රවෘත්ති සේවයකට අද (13) ප්‍රකාශ කොට ඇත.

මීට ප්‍රථම විනිසුරුවන් විසින් එල්ල කරන ලද චෝදනාවන්ට පරීක්ෂණ වලට භාජනය වී සිය නිර්දෝෂීභාවය ඔප්පු කොට තිබියදිත් බේඩි විසින් කරන ලද මෙම විවේචනය ඉතා අවිනීත හා අසාධාරණ එකක් යැයි ඔහු පවසා ඇත. එම නිසා මුරලි සැබෑ දක්ෂයකු බව පෙන්වා තිබියදී බේඩි විසින් කරන ලද ප්‍රකාශයට එරෙහිව ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නීතිඥයන් මාර්ගයෙන් ක්‍රියා කිරීමට කටයුතු යොදන බව ගුණසේකර මහතා දක්වා ඇත.


